මගේ අංකය: පොදු/ශානි/77/වාණිජ ගාස්තු/2008
වාණිජ අධිකාරී කාර්යාලය,
දුම්රිය මූලස්ථානය
කොළඹ 10.
2010. 01. 18

ප්‍ර.ඉ.(මා/ක), / ප්‍ර.ඉ.(සං/වි),
ග.අ. / ප්‍ර.දු.ග.,
සියළුම දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් (මා/ක),
සියළුම දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් (සං/වි),
ප්‍ර.අ.(කො), / ප්‍ර.අ.(අනු), / ප්‍ර.අ.(නා),
අභ්‍යන්තර විගණන,

## දුම්රිය මාර්ගය හා රක්ෂිත විවිධ මහජන උපයෝගිතා සඳහා යොදා ගැනීමේදී අයකරනු ලබන ගාස්තු සංශෝධනය - 2010.

පහත සඳහන් සේවා සැපයුම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු 2010.02.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත අයුරින් සංශෝධනය විය යුතුය.

### 1. ජලනල එලීම

ගාස්තු දික් අඩි 01ක් සඳහා පමණක් වන අතර ගෙවීම එක් වරක් පමණි.

| කාරණය | ගෘහස්ත | අවම ගාස්තු | වාණිජ | අවම ගාස්තු |
|---|---|---|---|---|
| ජලනල ½" - 1' | රු. 150/= | රු. 10,000/= | රු. 400/= | රු. 10,000/= |
| ජලනල 1' - 2' | රු. 400/= | රු. 12,000/= | රු. 800/= | රු. 20,000/= |
| 2' ඉහල | - | - | රු. 2,000/= | රු. 40,000/= |

### 2. දුරකථන රැහැන් / ප්‍රකාශ තන්තු රැහැන්

ගාස්තු දික් අඩි 01ක් සඳහා පමණක් වන අතර ගෙවීම එක් වරක් පමණි.

| | ගෘහස්ත | අවම ගාස්තු | වාණිජ | අවම ගාස්තු |
|---|---|---|---|---|
| තනි රැහැන් එක් යුගලයක් | රු. 75/= | රු. 1,000/= | රු. 100/= | රු. 2,000/= |
| යුගල 10ක් දක්වා | - | - | රු. 500/= | රු. 10,000/= |
| යුගල 10ට වැඩි | - | - | රු. 1,000/= | රු. 20,000/= |
| ප්‍රකාශ තන්තු රැහැන් | - | - | රු. 5,000/= | රු. 100,000/= |

### 3. විදුලි රැහැන්

ගාස්තු දික් අඩි 01ක් සඳහා පමණක් වන අතර ගෙවීම එක් වරක් පමණි.

| | ගෘහස්ත | අවම ගාස්තු | වාණිජ | අවම ගාස්තු |
|---|---|---|---|---|
| එකලා | රු. 100/= | රු. 5,000/= | රු. 250/= | රු. 15,000/= |
| තෙකලා | - | - | රු. 750/= | රු. 45,000/= |
| 11000 V | - | - | රු. 1,000/= | රු. 75,000/= |
| 11000V ට වැඩි | - | - | රු. 8,000/= | |

CamScanner

. විදුලි කණු හා දුරකථන කණු සඳහා අයකිරීම.

විදුලි කණු හා දුරකථන කණු සඳහා එක් කණුවකට රු. 500/=ක එක් වරක් පමණක් ගෙවන ගාස්තුවක් අවකර ගත යුතුය.

5. තෙල් නල

තෙල්නල සඳහා අඩියකට රු. 100/= බැගින් වාර්ෂික ගාස්තුවක් අයකල යුතුය.

6. කසල නල හෝ වෙනත් අපවහන නල

විෂ්කම්භය අඟල් 4ට අඩු ජලනල හෝ තෙල් නල නොවන කසල නල හෝ වෙනත් අපවහන නල සඳහා අවම වාර්ෂික බදු මුදල රු. 10,000/=කි. විෂ්කම්භය අඟල් 4ට වැඩි කසල නල හෝ වෙනත් අපවහන නල සඳහා එලන නල දිග ප්‍රමාණය අනුව ගණනය කරන මුදල හෝ අවම රු. 10,000/= යන දෙකින් වැඩි මුදල අයකල යුතුය.

විෂ්කම්භය 4" – 6" දක්වා දික් අඩියකට රු. 25/= (වාර්ෂිකව)
විෂ්කම්භය 6" – 12" දක්වා දික් අඩියකට රු. 50/= (වාර්ෂිකව)
විෂ්කම්භය 12" ට වැඩි දික් අඩියකට රු.100/= (වාර්ෂිකව)

7. දුම්රිය හරස් මාර්ග සඳහා බදු අය කිරීම.

| | මහ නගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා |
|---|---|---|---|
| හරස් මාර්ගයේ පළල 9' ට අඩු | රු. 3,000/= | රු. 2,000/= | රු. 1,000/= |
| හරස් මාර්ගයේ පළල 9' - 12' අතර | රු. 6,000/= | රු. 2,600/= | රු. 1,600/= |

12'-0' වැඩි හරස් මාර්ග සඳහා ගැස්තු අය කිරීම ඉහත සඳහන් හරස් මාර්ග පළලට සමානුපාතිකවම ගණනය කල යුතුය.

බදු ගෙවීම පැහැර හැර ඇති හරස් මාර්ග සඳහා රු. 670/=ක් වන පැරණි බදු මුදල 2008 වර්ෂය දක්වා අයකර ගෙන අනතුරුව ඉහත පරිදි බදු මුදල් අය කර ගත යුතුය.

දුම්රිය හරස් මහට අමතරව දුම්රිය රක්ෂිතය පිවිසුම් මාර්ගයක් ලෙසට භාවිත කරන්නේ නම් දුම්රිය මාර්ග මධ්‍යයේ සිට දෙපසට අඩි 10ක දුරක් අතහැර ඉතිරි රක්ෂිතයේ දුරට පහත සඳහන් පරිදි වර්ග අඩි 1ට වාර්ෂික ගාස්තුවක් අයකර ගත යුතුවේ.

මහ නගර සභා වර්ග අඩියකට රු. 45/=
නගර සභා වර්ග අඩියකට රු. 15/=
ප්‍රාදේශීය සභා වර්ග අඩියකට රු. 5/=

8. තාවකාලික හරස් මාර්ග

තාවකාලික හරස් මාර්ග වානිජ හෝ ව්‍යාපෘති කටයුතු සඳහා ලබාදීමේදී රු. 20,000/= (20' දක්වා) මාසික ගාස්තුවක්ද, පුද්ගලික කාර්යයක් සඳහා රු. 10,000/= (20' දක්වා) මාසික ගාස්තුවක්ද අයකල යුතුය.

9. දුම්රිය හරස් මාර්ග, තෙල් නල, කසල නල හා වෙනත් අපවහන නල සඳහා මුල් අවස්ථාවේදීම වසර 5 ක බදු මුදල් එක්වර අයකර ගැනීමට කටයුතු කල යුතුය.

10. මෙම කටයුතු සඳහා අදාල පාර්ශවයන් වසර පහෙන් පහට අළුත් කරන බදු ගිවිසුමකට දෙපාර්තමේන්තුව සමඟ බැඳිය යුතුය. සෑම ගිවිසුමක්ම ඒ සඳහා වන රු. 250/= ගාස්තුවක් ගෙවීමෙන් පසු සෑම වර්ෂ 5කට වරක්ම අළුත් කරවා ගත යුතුය.

දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත අදාල ජලනල, විදුලි රැහැන්, දුරකථන රැහැන් හෝ කණු ඉවත් කිරීමට සිදු වුවහොත් අදාල ආයතනය හෝ පුද්ගලයා තමන්ගේ වියදමින් ජලනල, විදුලි රැහැන්, දුරකථන රැහැන් හෝ කණු ඉවත් කිරීම සිදු කල යුතුය.

11. ඉහත සියළු කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව අයකරන ගාස්තු හෝ වෙනත් කම්කරු ගාස්තු අයකර ගත යුතු වේ නම් වෙනම අදාල ගාස්තු අයකර ගත යුතුය.

12. ඉහත සෑම ගණනය කිරීමකටම අදාලව අගය මත එකතු කලයුතු බදු (VAT) හෝ රජය වරින් වර අයකරන බදු මුදල් අයකර ගත යුතුය.

දුම්රිය සාමාන්‍යාධිකාරි